# සුරාබදු දෙපාර්තමේන්තුවේ

## වාර්ෂික වාර්තාව

## *2007*

# *2007 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව*

1. **හැඳින්වීම:**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණ විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, විස, විෂ, අබිං හා න්තරායකාරි ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමුහික වගකීමද, 2006 අංක 27 දරණ දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙලේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට සැලකිය යුතු අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සෑම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

2. **ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාවේ, නීත්‍යානුකූල නොවන මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් තොර නිරෝගිමත් සමාජයක් ගොඩනැගීමට දායක වීම.

3. **මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙනුත්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, විස විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

**පරමාර්ථයන් :**

අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරකෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. විස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.
ඈ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක

**ක්‍රියාකාරකම් :**

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.

ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.

ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.

ඈ. වස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම

ඉ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම

## 4. සංවිධාන ව්‍යුහය

2007.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (අපරාධ / පුහුණු) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යයන්තර විගණන) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සහකාර සුරාබදු කොමසාරිස් | : | 08 |
| පරිපාලන නිලධාරී | : | 01 |
| සුරාබදු අධිකාරී | : | 13 |
| ප්‍රධාන සුරාබදු පරීක්ෂක | : | 40 |
| සුරාබදු පරීක්ෂක | : | 142 |
| සුරාබදු සැරයන් මේජර් | : | 26 |
| සුරාබදු සැරයන් | : | 100 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 437 |
| සුරාබදු රියදුරු | : | 61 |
| රාජ්‍ය කළමනාකාර සහකාර සේවය | : | 92 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 38 |
| බංගලා භාරකරු | : | 03 |

## 5. මාණ්ඩලික වෙනස්කම්:

සුරාබදු කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කල පරාක්‍රම ඒකනායක බණ්ඩාර මහතා, 2007.09.23 වන දින සිට අමාත්‍යංශ ලේකම් ධූරයකට පත්වූ බැවින්, සුරාබදු කොමසාරිස් (අපරාධ / පුහුණු) ලෙස කටයුතු කල, ශ්‍රී.ලං.ප.සේ 1 පංතියේ, ඩී.ජේ.එම්.වී හපුආරච්චි මහතා, 2007.09.24 දින සිට සුරාබදු කොමසාරිස් ජනරාල් ලෙස පත් කරන ලදී.

2007 වර්ෂය තුලදී පහත නම් සඳහන් නිලධාරී මහතුන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

| | | | | |
|---|---|---|---|---|
| එස්. සිවානන්දන් මහතා | - | සුරාබදු කොමසාරිස් | - | 2007.03.07 |
| ඩබ්.පී.පී එච් ප්‍රනාන්දු මහතා | - | සුරාබදු අධිකාරී | - | 2007.08.16 |
| එන්.ඩී.ඒ රේමන්ඩ් මහතා | - | ප්‍රධාන සුරාබදු පරීක්ෂක | - | 2007.01.19 |
| යූ.ජී නයනානන්ද මහතා | - | සුරාබදු අධිකාරී | - | 2007.11.13 |
| පී.ජේ.ර්.පී ප්‍රනාන්දු මහතා | - | සුරාබදු පරීක්ෂක | - | 2007.12.05 |
| එම්.විල්බට් මහතා | - | සුරාබදු පරීක්ෂක | - | 2007.12.31 |

## 6. මානව සම්පත් සංවර්ධනය:

සුරාබදු කොමසාරිස් (පුහුණු / අපරාධ) යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙකු, සුරාබදු පරීක්ෂකවරයෙකු, සුරාබදු නියාමකවරයෙකු, කාන්තා සුරාබදු නියාමකවරුන් දෙදෙනෙකු සහ සුරාබදු රියදුරෙකු අනුයුක්තව ඇත.

දෙපාර්තමේන්තුවේ සිටින සියළුම නිලධාරීන් සඳහා අධ්‍යයන පුහුණුවීම්, ගිනි අවි පුහුණුවීම් සහ විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම මෙම ඒකකයේ මූලික කාර්යභාරය වේ.
සහකාර සුරාබදු කොමසාරිස් කොට්ඨාශ මට්ටමින් වැඩ මුළු 09 ක් පහත සඳහන් අයුරින්, නිලධාරීන් 133 ක් සඳහා පවත්වන ලදී.

| සහකාර සුරාබදු කොමසාරිස් කොට්ඨාශය | දිනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| උතුරු මැද පලාත | 2007.08.09 | 07 |
| වයඹ පලාත | 2007.08.10 | 17 |
| බස්නාහිර පලාත III | 2007.08.16 | 15 |
| බස්නාහිර පලාත II | 2007.08.23 | 17 |
| බස්නාහිර පලාත I | 2007.08.31 | 22 |
| දකුණු පලාත | 2007.09.06 | 14 |
| සබරගමුව පලාත | 2007.09.13 | 09 |
| ඌව පලාත | 2007.09.27 | 11 |
| මධ්‍යම පලාත | 2007.10.12 | 21 |

පහත සඳහන් නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන් පනාදරගම සුරාබදු අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී.

| කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | |
|---|---|---|
| 2007.01.22 - 2007.02.02 | සුරාබදු සැරයන් | 23 |
| 2007.03.24 - 2007.03.30 | සුරාබදු නියාමක | 25 |
| 2007.05.19 - 2007.05.25 | සුරාබදු සැරයන් (උසස්වීම් ලද) | 23 |
| 2007.06.02 - 2007.06.08 | සුරාබදු නියාමක | 32 |
| 2007.06.16 - 2007.06.23 | සුරාබදු කෝප්‍රල් / නියාමක | 29 |
| 2007.07.05 - 2007.07.06 | රාජ්‍ය කළමනාකරණ සේවය | 30 |
| 2007.07.07 - 2007.07.13 | සුරාබදු කෝප්‍රල් / නියාමක | 29 |
| 2007.07.21 - 2007.07.27 | සුරාබදු නියාමක | 28 |
| 2007.08.18 - 2007.08.25 | සුරාබදු කෝප්‍රල් / නියාමක | 34 |
| 2007.08.29 - 2007.09.04 | සුරාබදු නියාමක | 35 |
| 2007.09.15 - 2007.09.21 | සුරාබදු නියාමක | 25 |
| 2007.09.23 - 2007.09.27 | සුරාබදු කෝප්‍රල් / නියාමක | 37 |
| 2007.10.20 - 2007.10.27 | සුරාබදු නියාමක | 17 |
| 2007.11.03 - 2007.11.09 | සුරාබදු නියාමක | 25 |
| 2007.11.26 - 2007.11.30 | සුරාබදු නියාමක | 13 |

ඵලදායිතාවය, පාරිභෝගික ආරක්ෂාව, මහජන සම්බන්ධතාවය සහ තත්ත්ව කළමණාකරණය පිළිබඳව පුහුණුවීම් පාඨමාලා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පහත සඳහන් නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී.

| කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | |
|---|---|---|
| 2007.02.15 - 16 - 22 - 23 | සහකාර සුරාබදු කොමසාරිස් / සුරාබදු අධිකාරී | 22 |
| 2007.05.21 - 2007.05.22 | නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් / සහකාර සුරාබදු කොමසාරිස් / සුරාබදු අධිකාරී | 14 |

| | | |
|---|---|---|
| 2007.07.09 - 2007.09.11 | සුරාබදු පරීක්ෂක | 05 |
| 2007.07.16 - 2007.07.20 | සුරාබදු පරීක්ෂක | 10 |
| 2007.07.23 - 2007.07.27 | සුරාබදු අධිකාරී | 10 |
| 2007.08.17<br>2007.09.03 - 2007.09.14 | නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් | 01 |
| 2007.09.17 - 2007.09.19 | සුරාබදු පරීක්ෂක | 25 |
| 2007.09.17 - 2007.09.28 | සුරාබදු පරීක්ෂක | 10 |
| 2007.10.08 - 2007.10.19 | සුරාබදු පරීක්ෂක | 10 |
| 2007.10.15 - 2007.10.19 | සුරාබදු අධිකාරී / පරීක්ෂක | 12 |
| 2007.10.26 - 2007.11.02<br>2007.11.09 - 2007.11.16 | සුරාබදු පරීක්ෂක | 28 |
| 2007.11.12 - 2007.11.14 | සුරාබදු පරීක්ෂක | 11 |
| 2007.11.19 | සුරාබදු පරීක්ෂක | 35 |
| 2007.11.13 | සුරාබදු පරීක්ෂක | 30 |
| 2007.11.01 | රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරිනියන් | 36 |
| 2007.04.08 - 2007.04.09 | වෘත්තිය සමිති නිලධාරීන් | 22 |

2007 වසර තුල පහත නම් සඳහන් නිලධාරීන් විදෙස් පුහුණුවීම් සඳහා යොමු කරන ලදී

| නිලධාරියාගේ නම | තනතුර | සිට | දක්වා | රට |
|---|---|---|---|---|
| ඩී.ජ්.එම්.වී හපුආරච්චි මහතා | සුරාබදු කොමසාරිස් (පුහුණු / අපරාධ | 2007.01.22 | 2007.02.07 | සිංගප්පූරුව |
| ඒ. බෝදරගම මහතා | නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්) | 2007.12.01 | 2007.12.07 | ඉන්දියාව |
| ඩබ්.එම්.එම්.බී වන්සූරිය මහතා | සහකාර සුරාබදු කොමසාරිස් | 2007.12.08 | 2007.12.28 | ඉන්දියාව |
| එම්.ඩී.එම්.ඩබ්.කේ දිසානායක | සහකාර සුරාබදු කොමසාරිස් | 2007.07.22 | 2007.08.04 | තායිලන්තය |
| එස්.ඩී.එල් ද මැල්ලව මහතා | සහකාර සුරාබදු කොමසාරිස් | 2007.12.01 | 2007.12.07 | ඉන්දියාව |
| ජේ. ශාන්තදේව ද සිල්වා මහතා | සුරාබදු අධිකාරී | 2007.07.22 | 2007.08.24 | තායිලන්තය |
| චන්න වීරක්කොඩි මහතා | සුරාබදු අධිකාරී | 2007.12.01 | 2007.12.07 | ඉන්දියාව |
| එම්.ආර්.ඩබ් අමරසේන මහතා | සුරාබදු නියාමක | 2007.11.01 | 2007.12.03 | මලයාසියාව |

## 7. යටිතල සංවර්ධනය (ගොඩනැගිලි/වාහන)

අ. ගොඩනැගිලි (බාහිර ප්‍රදේශ)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| සුරාබදු කාර්යාලය - ගාල්ල | වැටක් ඉදි කිරීම | 7380.00 |
| සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය - මහනුවර | අළුත්වැඩියාවන් සහ පුළුල් කිරීම් | 370,908.70 |
| සුරාබදු අධිකාරී කාර්යාලය - පොලොන්නරුව<br><br>අධිකාරී නිල නිවස<br><br>පොලොන්නරුව සංචාරක | අළුත්වැඩියා කිරීම්<br><br><br>අළුත්වැඩියා කිරීම | 246,990.00<br><br><br>254,739.25 |

| | | |
|---|---|---|
| නිවාසය | ඉදි කිරීම | 1,522,714.69 |
| තංගල්ල සුරාබදු ස්ථානය | අළුත්වැඩියා කිරීම | 363,056.98 |
| මාදම්පේ සුරාබදු ස්ථානය | ජල ටැංකිය / ගේට්ටුව සහ වැට ඉදි කිරීම | 1,000,000.00 |
| සුරාබදු ස්ථානය - කැස්බෑව | නළ ළිඳක් ඉදි කිරීම | 240,350.00 |
| කොළඹ නගර කාර්යාලය | පරිඝණකාගාරය සඳහා මෙ.වො 60 ක විදුලිය සැපයීම<br>ගේට්ටුව සැකසීම සහ ජල බාධකයක් ඉදි කිරීම | 661,642.15<br>379,400.00 |
| කළුතර සුරාබදු අධිකාරී කාර්යාලය<br>කළුතර සුරාබදු ස්ථානය | අළුත්වැඩියා කිරීම<br>-එම- | 24,252.25<br>266,000.00 |
| කුරුණෑගල සහකාර සුරාබදු කොමසාරිස් නිල නිවස සහ සුරාබදු අධිකාරී නිල නිවස | ඉදි කිරීමේ කටයුතු | 6,752,000.00 |
| කුරුණෑගල සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාලය | වායු සමනය කිරීම | 78,000.00 |
| | වැසිකිලිය හා නල පද්ධතිය සකස් කිරීම | 82,473.00 |
| | විශේෂ මෙහෙයුම් ඒකක ගොඩනැගිල්ලේ කාමරයක් වෙන් කිරීම | 201,038.75 |

ආ. ගොඩනැගිලි (ප්‍රධාන කාර්යාලය - කොළඹ 2)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| පාලන නිලධාරීගේ කාර්යාලය / ලේඛණාගාරය/ සුරාබදු කොමසාරිස් (මුදල්) ගේ කාර්යාලය | අළුත්වැඩියාවන් සහ පිළිසකර කිරීම | 600,300.00 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අපරාධ) ගේ කාර්යාලය / සුරාබදු අධිකාරී කාර්යාලය / ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | අළුත්වැඩියාවන් සහ පිළිසකර කිරීම් | 123,400.00 |
| ගබඩාව / ලේඛණාගාරය | අළුත්වැඩියා කටයුතු | 200,000.00 |

ඇ. 2007 වර්ෂය තුලදී පහත සඳහන් වාහන මිලට ගෙන ඇත :-

| වාහන අංකය | වර්ගය | මිල |
|---|---|---|
| PB - 3156 | ඉසුසු කෲ කැබ් | රු. 2,242,500/= |
| PB - 3158 | එම | රු. 2,242,500/= |
| PB - 3159 | එම | රු. 2,242,500/= |
| PB - 3160 | එම | රු. 2,242,500/= |
| PB - 3162 | එම | රු. 2,242,500/= |
| LD - 9334 | ටාටා සිංගල් කැබ් | රු. 1,225,000/= |
| LD - 9337 | එම | රු. 1,225,000/= |
| LD - 9339 | එම | රු. 1,225,000/= |
| LD - 9340 | එම | රු. 1,225,000/= |

| | | |
|---|---|---|
| LD - 9341 | එම | රු. 1,225,000/= |

## 8. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂය තුල දෙවරක් සුරා බද්ද සංශෝධනය කරන ලදී. වසර 37 කට පසුව බෝතල් රා වෙනුවෙන් ද සුරාබද්ද වැඩි කරන ලදී. වැටලීම් මගින් නීති විරෝධි මත්පැන් නිශ්පාදනය සහ අලෙවිය මර්දනය කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාව ඇත. අළුතින් ක්‍රියාත්මක කරන ලද 2006 අංක 27 දරණ දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත යටතේ 4000 කට අධික වැටලීම් සංඛ්‍යාවක් සිදු කරන ලදී.

## 9. සුරාබදු ව්‍යුහය:

**අංක 1 වගුව**

| විස්තරය | ඒකකය | 2007.03.13 දින සිට (රු.) | 2007.10.25 දින සිට (රු.) |
|---|---|---|---|
| ඉක්ෂුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කල අරක්කු සම්මත ලීටරයකට | සම්මත ලීටර | 446/= | 510/= |
| විදේශීය මත්පැන් සම්මත ලීටරයකට | සම්මත ලීටර | 575/= | 640/= |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට | තොග ලීටර | 37/50 | 38/= |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට | තොග ලීටර | 53/50 | 54/= |
| වයින් ලීටරයක් සඳහා | ලීටර | 300/= | 365/= |
| දුම්කොළ මත සුරා බද්ද කි.ග්‍රෑ ඒකකට | කි.ග්‍රෑ.01 කට | 10/= | 10/= |
| බෝතල් රා | ලීටර 01 කට | 10/= | 10/= |

2006 වර්ෂයට වඩා 2007 වර්ෂයේ දී එකතු කර ලද සුරාබදු ආදායම 16.2% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

**අංක 11 වගුව**

මැත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය:

| වර්ෂය | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| 2001 | 6245.471 | 148.097 | 2.37 |
| 2002 | 8541.628 | 151.395 | 1.77 |
| 2003 | 10719.444 | 146.415 | 1.37 |
| 2004 | 13545.502 | 173.000 | 1.28 |
| 2005 | 16120.555 | 211.933 | 1.31 |
| 2006 | 20694.008 | 297.000 | 1.44 |
| 2007 | 23755.64 | 367.58 | 1.54 |

10. **අභ්‍යයන්තර විගණන ඒකකය :**

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයකුගේ අධීක්ෂණය යටතේ, රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුක්තව, අභ්‍යයන්තර විගණන ඒකකය වර්ෂය තුල ක්‍රියාත්මක විණි. අදාල වර්ෂය තුල, ප්‍රධාන කාර්යාලයට අදාලව විගණන විමසුම් 03 ක් හා, විගණන වාර්තා 02 ක් ඉදිරිපත් කර ඇත. උප කාර්යාල 27 ක් හා මත්පැන් නිශ්පාදනාගාර 07 ක් විගණනයට භාජනය කර ඇත. එමගින්, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය ඇතුළු නිකුත් ඇති චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරවීම් හඳුනාගෙන නිවරැදි කිරීමට කටයුතු කර ඇත. මීට අමතරව, අභ්‍යයන්තර විගණන අත් පොතක් කෙටුම් පත් කර ඇත.

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයේ සේවය කරන සියළුම මාණ්ඩලි නිලධාරීන්ගේ සාමාජිකත්වයෙන් යුක්තව, විගණන හා කළමනාකරණ කමිටුව වර්ෂය තුල තෙවරක් රැස්වී ඇත. මීට මෙම දෙපාර්තෙමින්තුවට අනුයුක්ත කර ඇති රජයේ විගණන අධිකාරීවරයා ද එහි නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේ. මානව සම්පත් ඇතුළු සෙසු සියළුම සම්පත් කාර්යාක්ෂම ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත.

11. **භාණ්ඩ තොග පරීක්ෂණ :**

2006 වර්ෂයට අදාල සියළු භාණ්ඩ තොග පරීක්ෂණ කටයුතු 2007 වර්ෂය තුලදී අවසන් කරන ලදී.

12. දුම්කොළ බදු පනත සහ දුම්කොළ සහ මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කරන ලද ග්‍රහණ විස්තර $ ඵ ` පරිශිෂ්ඨයේ ඇත.

13. **සුරාබදු හිඟ ආදායම් :**

2007 වර්ෂයේ අවසානය වන විට අයවීමට ඇති හිඟ සුරාබදු ආදායම් පිලිබඳ විස්තරයක් " ජේ " පරිශිෂ්ඨයේ ඇත. නියමිත වේලාවට සුරාබදු නොගෙවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. මෙම බදු මුදල් එකතු කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

14. **විගණන විමසුම් :**

අදාල වර්ෂය තුලදී විගණන විමසුම් 27 ක් ලැබුන අතර, ඉන් 25 කට 2007.12.31 දින වන විට පිලිතුරු සපයා ඇත. අභ්‍යයන්තර විගණන විමසුම් 02 ක් ලැබුණ අතර, ඒවාට පිලිතුරු සපයන ලදී.

15. **දෙපාර්තමේන්තු වත්කම් :**

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා වත්කම් දැක්වෙන ලේඛණයක් " ඔ " පරිශිෂ්ඨයේ ඇත.

16. අරමුදල් ගිණුම - $ඕ` පරිශිෂ්ඨය

17. අත්තිකාරම් ගිණුම - $ක` පරිශිෂ්ඨය

18. විසර්පන ගිණුම - $ග` පරිශිෂ්ඨය

19. ආදායම් ගිණුම - $ජ` පරිශිෂ්ඨය

20. **වර්ෂය තුලදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග:**

අ.

| | | |
|---|---|---|
| ර.බි 1 | : | ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි ඒ | : | විදේශීය ස්ප්‍රීතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි බී | : | කිරි පොන්ස සහ/හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි සී | : | රා හැර පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රීතුවලින් විදේශ ස්ප්‍රීතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය |
| ර.බි 3 | : | තොග වෙළඳ බලපත්‍රය |
| ර.බි 4 | : | සිල්ලරට විකුණුම් බලපත්‍රය |
| ර.බි 6 | : | බියර් පෝටර් බලපත්‍රය |
| ර.බි 7 | : | හෝටල් බලපත්‍රය |
| ර.බි 8 | : | හෝටල් පීඨිකා බලපත්‍රය |
| ර.බි 9 | : | විනෝද පීඨිකා බලපත්‍රය |
| ර.බි 10 | : | දුම්රිය භෝජනාගාර බලපත්‍රය |
| ර.බි 11 | : | ආපනාශාලා බලපත්‍රය |
| ර.බි 12 | : | තානායම් බලපත්‍රය |
| ර.බි 13 ඒ | : | ක්‍රීඩා සමාජ / සමාජශාලා බලපත්‍රය |
| ර.බි 14 | : | අවස්ථා බලපත්‍රය |
| ර.බි 15 | : | විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය |
| ර.බි 16 | : | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය |
| ර.බි 17 | : | පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය |
| ර.බි 18 | : | ඖෂධීය වයින් බලපත්‍රය |
| ර.බි 19 | : | විශේෂ බලපත්‍රය |
| ර.බි 22 ඒ | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය |
| ර.බි 22 බී | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය |

ආ. නිෂ්පාදන බලපත්‍ර

පැසුනු නොපැසුනු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ස්කාගාර බලපත්‍රය
- විනාකිරි බලපත්‍රය
- ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිලිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බලපත්‍රය

- එකතු කරන ස්ථාන බලපත්‍රය

ඈ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- පැසවූ මත්පැන්
- පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. කිතුල් ගස් පැසුණු රා නිශ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍ර

'ඒ' ශ්‍රේණියේ හෝටල් (ර.බි 7)
(ර.බි 8)
'බී' ශ්‍රේණියේ හෝටල් (ර.බි 7)
(ර.බි 8)

'සී' ශ්‍රේණියේ හෝටල් (ර.බි 7)
(ර.බි 8)

'ඒ ' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)
'බී' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)
'සී' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බි 22 බී)

ඌ ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

## 21. 2007 වර්ෂයේ බලපත්‍ර ලත් මත්පැන් නිෂ්පාදකයෝ

1. සීමාසහිත ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම, අංක 324, හයිලෙවල් පාර, ගලගෙදර, පාදුක්ක
2. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල
3. සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි (ලංකා) සමාගම, මාවතගම
4. සමුපකාර ස්කාගාරය, පයාගල
5. ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, අංක 565, මිහිදු මාවත, මාළඹේ
6. සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10
7. හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර
8. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් සමාගම, කොතලාවල, කඩුවෙල
9. සීමාසහිත ලයන් බෲවරි සමාගම, අංක 254, කොළඹ පාර, බියගම
10. සීමාසහිත මනෝර් ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල
11. සීමාසහිත මැකලම් බෲවරි (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ
    a. සීමාසහිත නිපොන් එක්ස්පෝ කම්පැනි, අංක 102, ශාන්ත ඇන්ඩෲ පාර, මෝදර, කොළඹ 15
12. සීමාසහිත පෙරිසිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5
13. සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත, දංකොටුව
14. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල
15. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 25/20, මහවත්ත පාර, එගොඩ උයන, මොරටුව
16. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ට්‍රිය, වාද්දුව
17. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, පස්සර පාර, විනීතගම, බදුල්ල
18. තික්කම් ඩිස්ටිලරීස්, අල්වායි, පේදුරුතුඩුව
19. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, මිල්ලෑව, මොරගහහේන
20. වලිකාමම් ඩිස්ටිලරීස්, වංකානෙයි
21. සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම

## 22. නිශ්පාදිත මත්පැන් ප්‍රමාණයන්

අංක 1 වගුව : මොලැසස් අරක්කු

| නිශ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|

| | | |
|---|---|---|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 11,619.94 | 5,655,019.32 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,413,535.02 | 639,251,617.65 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 5,007.87 | 2,344,704.44 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 2,377.44 | 1,041,505.99 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 29,449.76 | 13,640,845.91 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 25,225.35 | 11,304,820.90 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 329,370.28 | 150,032,251.78 |
| **එකතුව** | **1,816,585.66** | **823,270,765.99** |

අංක 2 වගුව : පොල් සහ පදම් කල අරක්කු:

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| ඒ.ර්.එප් (පුද්ගලික) සමාගම | 1,437.61 | 684,388.14 |
| ඇක්මී ලංකා කම්පැනි | 7,966.10 | 3,533,377.60 |
| සමුපකාර ස්කාගාරය | 814.68 | 362,748.78 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 2,502,527.61 | 1,130,202,339.76 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 3,055.31 | 1,369,135.26 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 554,026.50 | 251,031,133.84 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 2,114.31 | 945,038.35 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 9,085.32 | 4,057,623.38 |
| සීමාසහිත පෙරසිල් පුද්ගලික සමාගම | 18,765.43 | 7,900,246.03 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 7,315.57 | 3,297,322.85 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 315,477.51 | 140,953,058.96 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 8,673.70 | 3,891,312.92 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 659.58 | 304,725.64 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 37,528.78 | 17,151,965.88 |
| **එකතුව** | **3,469,448.01** | **1,565,684,417.39** |

අංක 3 වගුව : විශේෂ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 421,988.00 | 178,948,840.01 |
| ඒ.ර්.එප් (පුද්ගලික) සමාගම | 328,433.47 | 133,124,255.16 |
| සමුපකාර ස්කාගාරය | 22,531.89 | 10,215,476.40 |
| ක්ලැසික් නිෂ්පාදකයෝ | 26,406.47 | 11,600,091.61 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 34,750,886.75 | 14,530,317,835.11 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 342,093.82 | 136,507,171.14 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,023,113.27 | 813,185,577.14 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 136,871.19 | 57,039,104.25 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 183,992.29 | 77,993,335.31 |
| සීමාසහිත නිපොන් ලංකා සමාගම | 1,834.83 | 843,837.96 |
| සීමාසහිත පෙරසිල් පුද්ගලික සමාගම | 143,269.91 | 65,040,241.65 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 1,858,840.30 | 764,213,057.04 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 117,450.14 | 45,871,782.76 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 433,480.42 | 179,891,514.84 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 232,547.71 | 97,322,900.87 |
| සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 4,843.33 | 2,249,955.53 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 171,373.73 | 73,676,560.33 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 490,876.80 | 211,199,648.40 |
| **එකතුව** | **41,690,834.32** | **17,389,241,185.51** |

## 23. දේශිය නිෂ්පාදිත විදේශිය මත්පැන්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 2,784.84 | 1,637,721.35 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,157,279.84 | 674,732,083.68 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 1,396.44 | 814,667.15 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 805,894.06 | 468,894,329.66 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 872,586.40 | 503,981,561.80 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 72,890.79 | 42,428,661.86 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 38,125.64 | 22,502,321.10 |
| **එකතුව** | **2,950,958.01** | **1,714,991,346.6** |

## 24. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 1,058,431.500 | 39,746,779.65 |
| ලයන් බෲවරි සමාගම | 18,399,698.100 | 691,662,566.70 |
| මැකලම් බෲවරි සමාගම | 495,044.705 | 18,619,923.51 |
| **එකතුව** | **19,953,174.305** | **750,029,269.86** |

## 25. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| මැකලම් බෲවරි සමාගම | 402,527.130 | 21,580,321.34 |
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 5,156,403.600 | 276,379,737.15 |
| ලයන් බෲවරි සමාගම | 24,023,186.130 | 1,288,314,051.89 |
| **එකතුව** | **29,582,116.860** | **1,586,274,110.38** |

## 26. වයින්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| හෝම් ඩිලයිට් වයින් | 2,100.000 | 124,831.67 |
| ලංකා වයින් පුද්ගලික සමාගම | 42,581.250 | 2,503,045.99 |
| එස්.ඩී.ටී වයින් | 115.500 | 6,880.75 |
| සකේ වයින් (නිපොන් ලංකා සමාගම) | 196.122 | 58,836.69 |
| සෙන්ට් වයින් ලිමිටඩ් | 180.000 | 10,321.00 |
| **එකතුව** | **45,172.872** | **2,703,916.10** |

## 27. බෝතල් රා නිෂ්පාදකයෝ

බෝතල් ගත රා නිෂ්පාදකයන්ගේ නම් ද, නිෂ්පාදිත ප්‍රමාණයන් සහ අය කර ගන්නා ලද බදු මුදල් ද පහතින් දක්වා ඇත.

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| වංකානෙයි තල් සංවර්ධන සමුපකාරය | 82,391.250 | 823,012.50 |
| කමාන්ඩර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 240,005.000 | 1,432,346.00 |
| රිගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 471,920.000 | 3,750,422.40 |
| එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 77,256.000 | 586,208.70 |
| ගෝල්ඩන් රිගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ | 22,385.000 | 193,008.40 |

| | | |
|---|---|---|
| ගෝල්ඩන් රිගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, මාදම්පේ | 421,750.000 | 3,499,268.80 |
| හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 657,041.250 | 4,630,941.90 |
| මනිපායි බෝතල් රා නිෂ්පාදනාගාරය | 12,455.625 | 1,071,318.75 |
| මනෝරි ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ | 1,102,028.750 | 8,568,978.10 |
| නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ | 325,321.500 | 1,144,147.80 |
| ෂූටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 559,110.000 | 3,975,966.40 |
| සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය | 663,350.000 | 5,282,960.00 |
| සුපර් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 30,975.000 | 53,742.00 |
| ටී.එස්.ආර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 1,140,345.000 | 8,514,978.00 |
| තෙල්ලිපලෙයි බෝතල් රා නිෂ්පාදනාගාරය | 12,375.000 | 123,750.00 |
| ත්‍රී ලයන්ස් බෝතල් රා නිෂ්පාදකයෝ | 196,641.250 | 1,239,060.45 |
| වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 448,620.000 | 2,822,480.60 |
| | 6,463,970.625 | 47,712,590.80 |

## 28. ස්ප්‍රීතු

අංක 1 වගුව : පොල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| ඇක්මී ස්කාගාරය | 180,785.000 | 12,338.900 |
| බේරුවල ස්කාගාරය | 9,258,157.000 | 615,695.900 |
| සමුපකාර ස්කාගාරය | 2,047,178.000 | 161,075.300 |
| මෙස්ටිය ස්කාගාරය | 4,754,083.000 | 403,308.200 |
| රොක්ලන්ඩ් ස්කාගාරය | 689,806.900 | 522,836.900 |
| සිදුව ස්කාගාරය | 25,316,453.600 | 1,947,199.200 |
| වවුළුගල ස්කාගාරය | 944,266.000 | 64,302.400 |
| **එකතුව** | **43,190,729.500** | **3,726,756.800** |

අංක 2 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| තික්කම් ස්කාගාරය | 1,907,530.500 | 14,713.000 |
| වරණි ස්කාගාරය | 252,547.750 | 189,327.360 |
| වලිකාමම් ස්කාගාරය | 166,461.000 | 102,364.250 |
| **එකතුව** | **2,326,539.250** | **306,404.610** |

## 29. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිෂ්පාදනය සඳහා)

| ස්කාගාරය | නිෂ්පාදන ප්‍රමාණය සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|
| පැල්වත්ත | 4,453,140.900 |
| සෙවනගල | 2,291,676.400 |
| **එකතුව** | **6,744,817.300** |

## 30. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිෂ්පාදනය සඳහා ආනයනය කරන ලද)

| සමාගම | ආනයනය කල සම්මත ලීටර ප්‍රමාණය |
|---|---|
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 28,900,650.212 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,418,250.832 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 471,285.236 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 118,027.340 |
| **එකතුව** | **30,908,213.620** |

## 31. කර්මාන්තශාලා නිෂ්පාදනයන් සඳහා නිකුත් කල පරිපාක ස්ප්‍රීතු / දුර්වල ස්ප්‍රීතු / නිහඬ ස්ප්‍රීතු

| ස්කාගාරය | පරිපාක ස්ප්‍රීතු ලීටර | දුර්වල ස්ප්‍රීතු | නිහඬ ස්ප්‍රීතු |
|---|---|---|---|
| හිඟුරාන ස්කාගාරය, කොරාඹේ | - | 416,300.000 | - |
| හිඟුරාන ස්කාගාරය, කොරාඹේ | - | - | 731,740.000 |
| පැලවත්ත | 957,949.000 | - | - |
| සෙවනගල | 962,970.000 | - | - |
| **එකතුව** | **1,920,919.000** | **416,300.000** | **731,740.000** |

## 32. ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු ප්‍රමාණය

| ස්කාගාරය | නිෂ්පාදිත ප්‍රමාණය (ලීටර) | බලපත්‍රධාරීන්ට නිකුත් කල ප්‍රමාණය තොග ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|---|
| පැල්වත්ත | 32,560.500 | 32,336.000 | 167,272.50 |
| **එකතුව** | **32,560.500** | **32,336.000** | **167,272.50** |

## 33. විනාකිරි නිෂ්පාදනය

බලපත්‍ර ලද ගස් ගණන, නිෂ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

## 34. දුම්කොළ නිෂ්පාදනය සහ බද්ද

2007 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාල බදු මුදල මෙසේ ය.

| නිෂ්පාදනය (කි.ග්‍රෑ) | බදු මුදල (රු.ශත) |
|---|---|
| 3,242,898.500 | 32,428,985.50 |

## 35. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

අ. <u>කොළඹ ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ, සුරාබදු කොමසාරිස් (අපරාධ/පුහුණු) මගින් පාලනය වන, සුරාබදු අධිකාරිවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් තුන් දෙනෙකුගෙන් හා සෙසු නිලයන් දහසය දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

සුරාබදු කොමසාරිස් ජනරාල්තුමාට ලැබෙන මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා දිවයින පුරා සුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2007 වර්ෂය තුල මෙම ඒකකය මගින් සිදු කල අපරාධ ග්‍රහණ ඇතුළු අනෙකුත් ග්‍රහණ පිලිබඳ විස්තරයක් පහත සඳහන් කර ඇත.

| | |
|---|---|
| කරන ලද මුළු ග්‍රහණ සංඛ්‍යාව | 2000 |
| නීති විරෝධී ස්ප්‍රීතු පෙරීම් | 222 |
| නීති විරෝධී ස්ප්‍රීතු ලඟ තබා ගැනීම් | 1108 |
| නීති විරෝධී ස්ප්‍රීතු විකිණීම හා ලඟ තබා ගැනීම් | 133 |
| නීති විරෝධී රා විකිණීම් හා ලඟ තබා ගැනීම් | 26 |
| නීති විරෝධී රා ලඟ තබා ගැනීම් | 10 |
| රජයේ අනුමත අරක්කු හා බියර් විකිණීම් (බලපත්‍ර රහිත) | 70 |
| අරක්කු ලඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත) | 281 |
| නීති විරෝධී ලෙස ධාන්‍ය මත්පැන් හෙවත් බියර් විකිණීම | 39 |
| නීති විරෝධී ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම් | 24 |
| ගංජා ලඟ තබා ගැනීම් | 13 |
| නීති විරෝධී සිගරට් ලඟ තබා ගැනීම් | 04 |
| ග්‍රහණය කරන ලද ගංජා හේන් ප්‍රමාණය | 11 |
| වෙනත් වැරදි | 59 |

2007 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 22,457,750/= කි. බලපත්‍ර ස්ථාන සම්බන්ධයෙන් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 8,479,764/25 කි.

2007 වසරේ දී, මෙම ඒකකය මගින් ගංජා හේන් 11 ක් වැටලීමත්, නීති විරෝධී සිගරට් වැටලීම් 04 ක් මගින් සිගරැට් 147,000 අත්අඩංගුවට ගැනීමත්, එමගින් රජයට අයවිය යුතු විශාල මුදලක් රැක දීමට මෙම ඒකකයේ නිලධාරීන් සමත් විය.

ආ. <u>මධ්‍යම පලාත් ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් අපරාධ හා පුහුණු , සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) හා සුරාබදු අධිකාරී (විශේෂ මෙහෙයුම්) ගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, එක් සුරාබදු පරීක්ෂකවරයෙකු සහ සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු නියාමකවරුන් සය දෙනෙකු, කාන්තා සුරාබදු නියාමකවරියක් සහ සුරාබදු රියදුරෙකු ඇතුළු නිලධාරීන් එකළොස් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටී. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය එවකට මධ්‍යම, ඌව, උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල සක්‍රිය රාජකාරියේ යෙදී ඇත. 2004 වසරේ සිට මෙම ඒකකය සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝග හා උපදෙස් පරිදි දිවයින පුරාම විශේෂිත රාජකාරිවල නියුක්තව සිටී.

2007 වසරේදී සුරා වැටලීම් 1253 ක් සිදුකර පුද්ගලයින් 1253 ක් අත් අඩංගුවට ගෙන දඩ මුදල් ලෙස රුපියල් එක් කෝටි හාරලක්ෂ හැත්තෑ නවදහස් එකසිය පණහක් (10,479,150/=) රජයට අයකර දී ඇති අතර, මේ සඳහා නීති විරෝධී ලෙස පෙරීම් මධ්‍යස්ථාන 256 ක් වටලන ලදී. අක්කර 05 ක පමණ කංසා හේනක් වටලා, කංසා පැල 17,790 ක් විනාශ කර ඇත. බදු නොගෙවන ලද සිගරට් ග්‍රහණ 04 ක් සිදු කරමින්, නීති විරෝධී සිගරට් 103,820 ක් අත් අඩංගුවට ගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් රුපියල් 808,500/= ක දඩ මුදලක් අයකර ගෙන ඇත.

දිවයින තුල බලපත්‍ර ස්ථාන 361 ක් කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර කාර්මික අපරාධ වාර්තා 361 ක් ඉදිරිපත් කර ඇත. මින් රුපියල් 10,045,000/= ක සමථ මුදලක් රජයට අයකර දීමට සමත් වී ඇත.

ඇ. දකුණු පලාත් ඒකකය :

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සුරාබදු කොමසාරිස් අපරාධ හා පුහුණු , සහකාර සුරාබදු කොමසාරිස්ගේ (දකුණු පළාත) අධීක්ෂණය යටතේ, ක්‍රියාත්මක වන මෙම ඒකකය සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් දෙදෙනෙකු හා සුරාබදු නියාමකවරුන් 04 කුගෙන් සමන්විත විය. අදාල වර්ෂය තුල මෙම ඒකකය විසින් ග්‍රහණ 600 ක් සහ කාර්මික අපරාධ වාර්තා 62 ක් ඉදිරිපත් කර ඇත.

මාදු ගඟ ආශ්‍රිත බෙන්තර වල්අඹගල, ඇල්පිටිය, සහ හියාරේ ජලාශය ආදී ප්‍රධාන නීති විරෝධී මත්පැන් පෙරන ස්ථාන කිහිපයක් මෙම ඒකකයේ මැදිහත්වීමෙන් විනාශ කරන ලදී.

## 36. නිෂ්පාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන් සහ ප්‍රගතිය

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් (අපරාධ සහ පුහුණු) මගින් පාලනය වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙක්, ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙකු, කාන්තා සුරාබදු කෝප්‍රල්වරියක්, කාන්තා සුරාබදු නියාමිකාවක් සහ සුරාබදු රියදුරුවරයෙක් අනුයුක්තව සිටී. මීට අමතරව, ඔරුගොඩවත්ත ශ්‍රේලයින් රේගු අංගනයේ ස්ප්‍රීතු ආනයනයට සම්බන්ධ සියළු කටයුතු කිරීම පිනිස එක් සුරාබදු පරීක්ෂකවරයෙක් ද අනුයුක්ත කර ඇත.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියළුම ස්කාගාර, අරක්කු, බියර්, රා සහ වයින් නිෂ්පාදනාගාරවල නිෂ්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර ගැනීම සහ දිවයින පුරා පිහිටි තොග වෙළඳ බලපත්‍ර (ර.බි 03) පරීක්ෂාව සහ එහි පවතින වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීමත් සහ නිරන්තර අධීක්ෂණයට එම බලපත්‍ර ස්ථාන ලක් කිරීමත් ය.

තවද, මත්පැන් නිෂ්පාදනාගාර තොරතුරු සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාමත්, කාර්මික අපරාධ වාර්තාවලට අදාල තැගි මුදල් ගෙවීම සඳහා කටයුතු කිරීමත් මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදුකර ගෙන යනු ලබයි.

2007 වර්ෂය තුල ඉහත සඳහන් බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය කිරීම තුලින් පැවති වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා 108 ක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සමථ ගාස්තු වශයෙන් රුපියල් 4,794,962.50 ක ආදායමක් රජයට ලබා දී ඇත. 2007 වර්ෂයේ දී, එක් මත්පැන් නිෂ්පාදනාගාරයක් තුල අරක්කු නිෂ්පාදනයේ දී සිදු කරන ලද බරපතල අක්‍රමිකතාවක් ග්‍රහණය කල අතර, ග්‍රහණයට අදාල කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට භාර දී ඇත. නීති උපදෙස් පරිදි ඉදිරි කටයුතු කර ගෙන යනු ලැබේ. ස්ප්‍රීතු අපතේ යාමේ සීමාව ඉක්මවා කටයුතු කල තවත් නිෂ්පාදනාගාරයක් පිලිබඳව අනාවරණය කර ගත් අතර, ඒ පිලිබඳව සහකාර සුරාබදු කොමසාරිස්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් පරීක්ෂා කර ගෙන යනු ලබයි. ඉලක්ක ගතකර ඇති සුරාබදු ආදායම ලඟා කර ගැනීම සඳහා මෙම ඒකකය විසින් මත්පැන් නිෂ්පාදන ආයතන නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම තුලින් අපේක්ෂිත බදු ආදායම් ඉලක්කය සපුරා ගැනීමට දායක වී ඇත.

## 37. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ නීතිය බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මත්ද්‍රව්‍ය ඒකකය කොළඹ ඩී.ආර් විජේවර්ධන මාවතේ ක්‍රියාත්මක වේ. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු ඇතුළු නිලධාරීන් 26 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් මගින් මෙම ඒකකයේ කාර්යයන් මෙහෙයවනු ලබයි.

2007 වර්ෂයේදී ග්‍රහණ 693 ක් සිදුකර ඇති අතර, ඒ මගින් මත්ද්‍රව්‍ය අපරාධකරුවන් ලෙස පිරිමි 573 ක් හා ගැහැණු 89 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ග්‍රහණ 693 න් 261 ක් හෙරොයින් සම්බන්ධවූ ඒවා වූ

අතර, 401 ක් ගංජා සම්බන්ධ ග්‍රහණ විය. සිද්ධීන් 40 සඳහා මහාධිකරණය ඉදිරියේ නඩු පැවරුනු අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 1,618,250/= ක් අයකර ගෙන ඇත.

## 38. මත්පැන් පරිභෝජනය

මත්පැන් පරිභෝජන වාර්තා පරීක්ෂාවේ දී, බියර් සම්බන්ධයෙන් 2006 වර්ෂයට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කලද, අරක්කු පරිභෝජනයේ වැඩිවීමක් 2007 වර්ෂය තුල පෙන්වා ඇත. පරිභෝජනය වැඩිවීම ප්‍රධාන වශයෙන් පෙන්නුම් කරනුයේ, කොළඹ, ගම්පහ හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ය. මීට හේතු වන්නේ, මෙම දිස්ත්‍රික්ක තුල 2007 වර්ෂයේ දී කරන ලද සුරා අපරාධ ග්‍රහණයන් ය. එම සංඛ්‍යා මෙසේ ය:-

| | සුරා අපරාධ ග්‍රහණ |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 4363 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 6811 |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 10252 |

මෙම සංඛ්‍යා ලේඛණ අනුව, මෙම දිස්ත්‍රික්කවල සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකක මගින් නීත්‍යානුකුල නොවන මහා පරිමාණ මත්පැන් නිශ්පාදන ග්‍රහණය කිරීම් ද සිදු කර ඇත. මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස මෙම දිස්ත්‍රික්කවල නීත්‍යානුකුල මත්පැන් භාවිතයේ වර්ධනයක් 2007 වර්ෂයේ සංඛ්‍යා ලේඛණවලින් දිස්වේ.

බාහිර නිරීක්ෂකයන්ගේ නිරීක්ෂණ අනුව ද, නීත්‍යානුකුල නොවන මත්පැන්වල අඩුවීමක් පෙන්නුම් කරන බවට අදහස් දක්වා ඇත. පොලිස් දෙපාර්තමේන්තුව මගින් සුරා අපරාධ මර්ධනය සඳහා සිදු කරන කාර්යයභාරය පැසිසිය යුතු ය. මෙලෙස තාවකාලික වශයෙන් නීත්‍යානුකුල මත්පැන් පරිභෝජනයේ වර්ධනයක් පෙන්නුම් කලද, දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව අනාගතයේ දී පරිභෝජනයේ අඩුවීමක් අපේක්ෂා කල හැකිය.

## 39. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුල නීති විරෝධි මත්පැන් උවදුර මැඩලීම සම්බන්ධ වැටලීම් ප්‍රමාණය වැඩිවී ඇත. මෙම වර්ෂය තුලදී ග්‍රහණ 58000 ක් ඉලක්ක කර තිබූ අතර, ග්‍රහණ 56476 ක් සිදු කරන ලදී. දඩ මුදල් වශයෙන් රුපියල් 269,220,017/= ක මුදලක් අය කර ගෙන ඇත.

2006 වසර හා සසඳන කල සිදුකල ග්‍රහණවල වැඩිවීමේ ප්‍රතිශතය 3.48% කි.

## 40. පහරදීම් හා අවහිර කිරීම්

- හම්බන්තොට සුරාබදු ස්ථානයේ නිලධාරීන් විසින් ගංජා පිලිබඳ ග්‍රහණයක් සිදු කිරීමේදී ව්‍යාජ ගැණුම්කරු වශයෙන් යොදා සිටි සුරාබදු නිලධාරියාගෙන් රජයේ මුදල් රුපියල් 228, 000/- ක් පැහැර ගෙන පලායාම පිලිබඳ තණමල්විල පොලිසියට පැමිණිලි කර ඇත. සැකකරු විවෘත වරෙන්තු පිට සිටී.
- 2007.07.31 වන දින, දකුණු පලාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්, ඉඳුරුව අකුරුවැල්ල ප්‍රදේශයේ ග්‍රහණයක් සිදු කිරීමට ගිය අවස්ථාවේ රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් අදාල වූදිතයන්ට එරෙහිව බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති අතර, විභාගවෙමින් පවතී.

## 41. මූල්‍ය කළමනාකරණය හා ප්‍රතිසංස්කරණ වැඩ සටහන

මෙම වැඩ සටහනේ අරමුණ වන්නේ දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය නවීකරණය කර ගැනීම හා මූල්‍ය කළමනාකරණ රාමුව ශක්තිමත් කර ගැනීම සහ මූල්‍ය ඌණතාවයන් පාලනය කිරීමට රජයට සහය වීමයි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය තුලින් දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට සතියක පරිඝණක පුහුණුවක් ලබා දෙන ලදී

# සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද සුරාබදු ආදායම රුපියල් මිලියන 24052 කි. මෙය 2006 වර්ෂයට වඩා 16.2% වර්ධනයකි. සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 56474 කි. මේ අනුව, අදාල වර්ෂය තුලදී දෙපාර්රැතමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවීම ගැන සතුටු වෙමි. පසුගිය වසර හා සසඳන කල අරක්කු පරිභෝජනයේ වැඩිවීමක් පෙන්නුම් කරනුයේ, නීත්‍යානුකූල නොවන මත්පැන් සාර්ථක ලෙස පාලනය කිරීම නිසා ය.

දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වයට හේතු වූයේ සීමිත සම්පත් මනා ලෙස උපයෝගී කර ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමණාකරණයක් තුලින්, මෙහෙයුම් ක්‍රියාවලියේ ඇතිකල ගුණාත්මක වර්ධනයයි.

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වයන් සලසාදීමෙන් මාගේ ක්‍රියාකාරිත්වයට ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපති තුමාටත්, ගරු රාජ්‍ය ආදායම්, මුදල් අමාත්‍ය සහ නියෝජ්‍ය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙයවීමෙන් හා මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණය හා නිරන්තර උපදෙස් දීමෙන් බාධක මග හරවා ගැනීමට දායකවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නොයෙක් අයුරින් සහය දුන් මුදල් අමාත්‍යංශයේ සියළුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුන සහය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සමීපව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහය දැක්වූ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කර සිටිමි.

ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදන සපයන මූල්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන විසින් මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන අනගි සහය පිලිබඳව ස්තුතිය පිරිනමන අතර, මෙම දෙපාර්තමේන්තුවේ නවීකරණ වැඩ සටහන සාක්ෂාත් කර ගැනීම් වස් එම ආයතනයේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂිකා සහ " ප්‍රයිස්වෝටර් හවුස් කූපර්ස් පුද්ගලික සමාගමේ උපදේශක මහත්ම මහත්මීන් විසින් දෙනු ලැබූ මාර්ගෝපදේශකත්වය වෙනුවෙන් මාගේ විශේෂ ස්තුතිය ඔවුනට පිරිනමනු කැමැත්තෙමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

**(වසන්ත හපුආරච්චි)**
**සුරාබදු කොමසාරිස් ජනරාල්**

-/විජේ